# දළ ජාතික නිෂ්පාදිතය ආදයම සහ වියදම

**සමස්ත උපනතීන්**

1985 වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද. දේ. නි.) සියයට 5.0 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 1984 දී එහි වර්ධනය සියයට 5.1 ක් විය. මූර්ත වශයෙන් බලන කල පිටතට ගලා ගිය ශුද්ධ සාධක ආදයම් ප්‍රමාණය අඩුවීම 1985 දී වූ හිතකර සිදුවීමක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1984 දී සියයට 5.1 ක වැඩිවීමක් දැක් වූ මූර්ත දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි.) මෙම වසරේ දී සියයට 5.3 කින් වැඩිවිය.

**1.1 සංඛ්‍යා සටහන**

**ජාතික ආදයම් සංඛ්‍යා 1983 – 1985**

| ශීර්ෂය | වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය (සියයට) | |
|---|---|---|---|---|---|
| | 1983(අ) | 1984(අ) | 1985(අ) | 1984 | 1985 |
| 1. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 113,878 | 140,039 | 149,415 | 23·0 | 6·7 |
| 2. ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව ද. දේ. නි. .. | 99,375 | 104,395 | 109,570 | 5·1 | 5·0 |
| 3. පවත්නා සාධක වියදම් මිළ අනුව ද.ජා.නි. | 110,664 | 136,638 | 146,005 | 23·5 | 6·9 |
| 4. ස්ථාවර (1982) වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 96,439 | 101,399 | 106,733 | 5·1 | 5·3 |
| 5. මැදි වසර ජනගහණය ('000) .. | 15,416 | 15,599 | 15,837 | 1·2 | 1·5 |
| 6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (රුපි.) | | | | | |
| i. පවත්නා මිළ අනුව | 7,179 | 8,759 | 9,219 | 22·0 | 5·3 |
| ii. ස්ථාවර මිළ අනුව .. | 6,256 | 6,500 | 6,739 | 4·0 | 3·7 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

පවත්නා සාධක වියදම් මිල යටතේ 1985 දළ ජාතික නිෂ්පාදිතය රුපියල් දශ ලක්ෂ 1,46,000 ක් වශයෙන් ගණනය කර ඇත. මෙය 1984 වසර සමග බලන විට සියයට 6.9 ක වැඩිවීමකි. ද. ජා. නි. මූර්ත වැඩිවීම ගැන සලකා බලන කල ආරෝපිත ද. ජා. නි. ගැලපුම සියයට 1.5 කින් පමණ වැඩි වෙයැයි ඇස්තමේන්තු කර තිබේ. මෙය පෙර වසරේ වූ සියයට 17.4 ක වැඩිවීමට වෙනස් වූ ක්‍රියාවලියකි. ආරෝපිත ද. ජා. නි. ගැලපුමෙහි වර්ධන වේගයෙහි මෙම කැපී පෙනෙන අඩුවීමට මූලික වශයෙන් හේතු වූයේ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි අපනයන මිල පහත වැටීමයි.

1984 දී ඇස්තමේන්තු ගත ජනගහණයට වඩා සියයට 1.5 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1985 දී ශ්‍රී ලංකාවේ ජනගහණය එක් කෝටි 58 ලක්ෂයක් වශයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇත. මේ නිසා ඒක පුද්ගල ද. ජා. නි. රු. 9,219 ක් (එ. ජ. ඩොලර් 339) වේ. මූර්ත වශයෙන් බලන විට ඒක පුද්ගල ආදායම සියයට 3.7 කින් වැඩිවී තිබෙන අතර එම වැඩිවීම 1984 දී සිදුවූ වැඩිවීමට වඩා ආන්තික අඩු වීමක් දක්වයි.

ශ්‍රී ලංකාවේ වෙළෙඳ අනුපාතයෙහි සියයට 22.5 ක අඩුවීමක් 1985 දී දක්නට ලැබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 1985 දී මූර්ත ද. ජා. නි. සියයට 0.4 කින් ආන්තික වශයෙන් අඩුවිය. මෙය වෙළෙඳ අනුපාතයෙහි වැඩි දියුණුවීම් නිසා මූර්ත ද. ජා. නි. 1983 දී සියයට 8.6 කින්ද, 1984 දී සියයට 9.9 කින්ද සිදු වූ වැඩිවීමට වඩා ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් ගනී.

1985 වසරේදී ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන් දයක වූ අංශ ලෙසට කෘෂිකර්මය, නිමැවුම් කර්මාන්තය හා වෙළෙඳාම් යන අංශ දැක්විය හැකි අතර ගමනාගමන හා බැංකු කටයුතු අංශ ද එකී වර්ධනයෙහි ලා සැලකිය යුතු මෙහෙයක් ඉටු කර ඇත. පෙර වසරේ පැවති පසු බැස්මෙන් නැඟී සිටි කෘෂිකර්මාන්තය මෙම වසරේ ආර්ථික වර්ධනයේ අතිශයින් වැදගත් ප්‍රභවය විය.

**ආංශීය ක්‍රියාකාරිත්වය**

1982–1985 කාල පරිච්ඡේදය සඳහා වූ ආංශීය වර්ධන අනුපාතයන් 1.3 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1984 වසරේ දී ආන්තික අඩුවීමක් දැක්වූ කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්ත අංශය, 1985 වසරේ දී සියයට 8.6 න් වර්ධනය විය. තේ උප අංශයේ අඩු වර්ධන-යක්ද, රබර් උප අංශයේ ඍන වර්ධනයක් ද පැවතුණු නමුත් කෘෂිකාර්මික අංශයේ මෙම වර්ධනය පවත්වා ගැනීමට හැකි විය. සමස්ත කෘෂිකර්ම අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල් උප අංශයේ සිදු වූ විශාල වර්ධනය හා වී උප අංශයේ සිදු වූ වර්ධනයන්ය. පොල් උප අංශයේ සිදුවූ සියයට 52.3 ක වර්ධනය මෑත කාලයේ දී සිදු නොවූ තරම් වර්ධනයකි. 1984 දී වී උප අංශයේ වූ ආන්තික අඩුවීම වෙනස් කරමින් 1985 දී එම අංශය සියයට 10.0 ක වර්ධනයක් දැක්විය. අනෙකුත් කෘෂිකර්ම උප අංශයේ සිදුවූ වර්ධනය පෙර වසරේ වර්ධනයට වඩා මඳ විය. 1985 දී ධීවර කර්මාන්ත උප අංශය පසුගිය වසරට වඩා සුළු වශයෙන් යහපත් වූ තත්ත්වයක් අත් කර ගෙන ඇත.

සමස්ත නිමැවුම් කර්මාන්ත අංශයෙහි වර්ධන වේගය 1984 දී සියයට 12.3 සිට 1985 දී සියයට 5.2 දක්වා අඩුවිය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කර්මාන්ත නිෂ්පාදන උප අංශයේ වූ වර්ධන වේගය සියයට 15.0 සිට සියයට 5.0 දක්වා පහත වැටීමය.

**1 . 2 සංඛ්‍යා සටහන**

**දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය 1983 – 1985**


**(ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව)**

| අංශය | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| | 1983(අ) | 1984(අ) | 1985(අ) | 1984 | 1985 |
| 1· කෘෂිකර්මය, වන හා ධීවර .. | 26,212 | 26,113 | 28,366 | –0·4 | 8·6 |
| 1·1 තේ .. | 2,309 | 2,681 | 2,759 | 16·1 | 2·9 |
| 1·2 රබර් .. | 865 | 878 | 851 | 1·5 | – 3·1 |
| 1·3 පොල් .. | 2,992 | 2,513 | 3,828 | –16·0 | 52·3 |
| 1·4 වී .. | 6,318 | 6,166 | 6,783 | –2·4 | 10·0 |
| 1·5 අනෙකුත් (අතුරු භෝග; වන හා ධීවර ඇතුළු) .. | 13,728 | 13,875 | 14,145 | 1·1 | 1·9 |
| 2· පතල් හා කැනීම් .. | 2,413 | 2,449 | 2,486 | 1·5 | 1·5 |
| 3· නිමැවුම් කර්මාන්ත .. | 13,710 | 15,390 | 16,193 | 12·3 | 5·2 |
| 3·1 වෘක්ෂ භෝග සැකසීම .. | 2,715 | 2,983 | 3,222 | 9·9 | 8·0 |
| 3·2 අනෙකුත් .. | 10,995 | 12,407 | 12,971 | 12·8 | 4·5 |
| 4· තැනීම් .. | 8,039 | 8,030 | 8,070 | –0·1 | 0·5 |
| 5· සේවා .. | 49,001 | 52,413 | 54,455 | 7·0 | 3·9 |
| 6· ද·දේ·නි· .. | 99,375 | 104,395 | 109,570 | 5·1 | 5·0 |
| 7· විදේශීය ශුද්ධ සාධක ආදයම .. | – 2,936 | – 2,996 | –2,837 | — | — |
| 8· ද·ජා·නි· .. | 96,439 | 101,399 | 106,733 | 5·1 | 5·3 |

(අ) තාවකාලිකයි

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# දළ ජාතික නිෂ්පාදිතය




22505
12 APR 2009

ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.3 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1983—1985


| අංශය | වටිනාකම (රු: දශ ලක්ෂ) | | | ද.ජා.නි. හි ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රු. දශ ලක්ෂ) | | ද.ජා.නි. වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983(අ) | 1984(අ) | 1985(අ) | 1983 | 1984 | 1985 | 1984 | 1985 | 1984 | 1985 |
| 1. කෘෂිකර්මය, දුව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 26,212 | 26,113 | 28,366 | 27·2 | 25·8 | 26·6 | – 99 | 2,253 | – 2·0 | 42·2 |
| 1.1 කෘෂිකර්මය | 21,868 | 22,300 | 24,504 | 22·7 | 22·0 | 23·0 | 432 | 2,204 | 8·7 | 41·3 |
| 1.1.1 තේ | 2,309 | 2,681 | 2,759 | 2·4 | 2·6 | 2·6 | 372 | 78 | 7·5 | 1·5 |
| 1.1.2 රබර් | 865 | 878 | 851 | 0·9 | 0·9 | 0·8 | 13 | – 27 | 0·3 | – 0·5 |
| 1.1.3 පොල් | 2,992 | 2,513 | 3,828 | 3·1 | 2·5 | 3·6 | –479 | 1,315 | – 9·7 | 24·6 |
| 1.1.4 වී | 6,318 | 6,166 | 6,783 | 6·6 | 6·1 | 6·4 | –152 | 617 | – 3·1 | 11·6 |
| 1.1.5 අනෙකුත් | 9,384 | 10,062 | 10,283 | 9·7 | 9·9 | 9·6 | 678 | 221 | 13·7 | 4·1 |
| 1.2 දුව ආදී වන ද්‍රව්‍ය | 1,816 | 1,889 | 1,923 | 1·9 | 1·9 | 1·8 | 73 | 34 | 1·5 | 0·6 |
| 1.3 ධීවර | 2,528 | 1,924 | 1,939 | 2·6 | 1·9 | 1·8 | –604 | 15 | –12·2 | 0·3 |
| 2. පතල් හා කැණීම් කටයුතු | 2,413 | 2,449 | 2,486 | 2·5 | 2·4 | 2·3 | 36 | 37 | 0·7 | 0·7 |
| 3. නිමැවුම් කර්මාන්ත | 13,710 | 15,390 | 16,193 | 14·2 | 15·2 | 15·1 | 1,680 | 803 | 33·9 | 15·1 |
| 3.1 අපනයන සැකසීම | 2,715 | 2,983 | 3,222 | 2·8 | 2·9 | 3·0 | 268 | 239 | 5·4 | 4·5 |
| 3.2 නිෂ්පාදන කර්මාන්ත | 8,953 | 10,296 | 10,811 | 9·3 | 10·2 | 10·1 | 1,343 | 515 | 27·1 | 9·7 |
| 3.3 කුඩා සහ අනෙකුත් කර්මාන්ත | 2,042 | 2,111 | 2,160 | 2·1 | 2·1 | 2·0 | 69 | 49 | 1·4 | 0·9 |
| 4. තැනීම් | 8,039 | 8,030 | 8,070 | 8·3 | 7·9 | 7·6 | – 9 | 40 | – 0·2 | 0·7 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 1,161 | 1,239 | 1,313 | 1·2 | 1·2 | 1·2 | 78 | 74 | 1·6 | 1·4 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව | 11,281 | 12,437 | 12,959 | 11·7 | 12·3 | 12·1 | 1,156 | 522 | 23·3 | 9·8 |
| 7. තොග සහ සිල්ලර වෙළඳාම | 20,738 | 22,029 | 22,925 | 21·5 | 21·7 | 21·5 | 1,291 | 896 | 26·0 | 16·8 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපළ | 4,130 | 4,526 | 4,975 | 4·3 | 4·5 | 4·7 | 396 | 449 | 8·0 | 8·4 |
| 9. නිවාස අයිතිය | 3,315 | 3,381 | 3,432 | 3·4 | 3·3 | 3·2 | 66 | 51 | 1·3 | 1·0 |
| 10. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු | 3,786 | 4,165 | 4,432 | 3·9 | 4·1 | 4·2 | 379 | 267 | 7·7 | 5·0 |
| 11. සේවා (අන් තැනෙක සඳහන් නොවන) | 4,590 | 4,636 | 4,419 | 4·8 | 4·6 | 4·2 | 46 | –217 | 0·9 | – 4·1 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 99,375 | 104,395 | 109,570 | 103·0 | 103·0 | 102·7 | 5,020 | 5,175 | 101·2 | 97·0 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | –2,936 | –2,996 | –2,837 | – 3·0 | –3·0 | –2·7 | – 60 | 159 | – 1·2 | 3·0 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 96,439 | 101,399 | 106,733 | 100·0 | 100·0 | 100·0 | 4,960 | 5,334 | 100·0 | 100·0 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව



පතල් හා කැනීම් කටයුතු අංශයේ වර්ධනය සියයට 1.5 ක් වශයෙන් පැවැතිණි. කැනීම් කටයුතු වල වර්ධනය මඳවීම හා මැණික් අපනයනයන් අඩුවීම මෙම පහත් වර්ධනයට හේතු විය.

පෙර වසරේ සියයට 0.1 ක ආන්තික අඩුවීමක් දක්වූ තැනීම් කටයුතු අංශය 1985 වසරේදී සියයට 0.5 කින් වර්ධනය විය. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා අංශයෙහි එකතු වූ වටිනාකම, පෙර වසරට සමාන වේගයකින් වැඩිවිය. විදුලි උත්පාදනය සියයට 9.0 කින් පමණ මෙම වසරේ දී වැඩිවිය.

ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරු අංශය 1985දී පෙර වසරට මඳක් අඩු වූ සියයට 4.2 ක වර්ධනයක් සටහන් කළේය. තොග සහ සිල්ලර වෙළෙඳාම් අංශය පෙර වසරට වඩා අඩු වේගයකින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපනයන උප අංශයේ සෘණ වර්ධනයයි. ආනයන උප අංශයේ වර්ධනය පෙර වසරට වඩා වැඩිවිය. බැංකු කටයුතු, රක්ෂණය හා නිශ්චල දේපල අංශය 1985 දී සියයට 9.9 ක වර්ධන වේගයක් සටහන් කළේය.

නිවාස අයිතිය හා රාජ්‍ය පරිපාලන යන අංශ දෙකම මෙම වසරේදී අඩු වර්ධන වේගයන් දක්වා ඇත. නිවාස අයිතිය සියයට 1.5 කින් වැඩි වූ අතර රාජ්‍ය පරිපාලනය සියයට 6.4 කින් වැඩි විය. සංචාරක කර්මාන්තයේ අයහපත් තත්ත්වයේ බලපෑම් වලට හසු වූ සේවා අංශය, 1985 දී සියයට 4.7 කින් අඩුවිය.

**වියදම් රටාව**

දළ දේශීය වියදමෙහි (ද. දේ. වි.) වර්ධන වේගයෙහි අඩුවීම තවදුරටත් පැවැතිණි. 1983 දී සියයට 18.6 හා 1984 දී සියයට 16.4 ක වර්ධනය හා සැසඳු කල, 1985 දී ද. දේ. වි. වර්ධන වේගය සියයට 10.0 ක් විය.

පෙර වසරට වඩා රුපියල් දශ ලක්ෂ 16,300 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1985 දී පවත්නා වෙළෙඳ මිල අනුව දළ දේශීය වියදම රුපියල් දශ ලක්ෂ 179,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 1985 දී රුපියල් දශ ලක්ෂ 123,200 මට්ටමකට ළඟා වෙමින් පෞද්ගලික පරිභෝජන වියදම සියයට 10.7 කින් වැඩි වී ඇත. මින් විදේශ භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා රුපියල් දශ ලක්ෂ 27,000 ක් වැය වූ අතර එය පෙර වසරට වඩා සියයට 24.3 ක වැඩිවීමක් දක්වයි. මෙරට නිපැයු භාණ්ඩ සඳහා වැය වූ මුදල පෙර වසරට වඩා සියයට 7.4 ක වැඩිවීමක් දක්වමින් රුපියල් දශ ලක්ෂ 96,200 ලෙස සටහන් වේ. රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම පෙර වසරේ වියදමට වඩා සියයට 23.4 කින් වැඩිවිය.

තොග වෙනස්වීම්ද ඇතුලත් වන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පෙර වසරේ සියයට 13.0 වැඩිවීම හා සසඳන විට මෙම වසරේදී සියයට 4.1 පමණ වැඩි විය. 1984 වූ සියයට 11.8 ක වර්ධන තත්ත්වය වෙනස් කරමින් මෙම වසරේදී පෞද්ගලික හා රාජ්‍ය සංස්ථා යන දෙඅංශයම සියයට 7.3 ක අඩුවීමක් පෙන්නුම් කරයි. රාජ්‍ය අංශයේ දළ ප්‍රාග්ධන සම්පාදනය 1985 දී සියයට 57.3 කින් වැඩි විය. එය 1984 දී වැඩි වූයේ සියයට 18.9 කිනි.

පෙර වසරේ සියයට 11.9 ක වර්ධනය හා සංසන්දනය කර බලන කල්හි මෙම වසරේදී දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 3.9 ක වැඩිවීමක් දක්වයි. 1984 දී සියයට 5.0 ක වැඩිවීමක් පෙන්නුම් කල ආනයනික ආයෝජන භාණ්ඩයන්හි මුළු වටිනාකම මෙම වසරේදී සියයට 17.1 ක අඩුවීමක් පෙන්නුම් කරයි. නැව් හා ගුවන්යානා හැර අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩයන්හි ආනයනය මෙම වසර තුළදී සියයට 25.1 කින් අඩු විය. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයනික ප්‍රමාණය 1984 දී සියයට 28.9 ක් වූ අතර 1985 දී එය සියයට 23.1 ක් විය.

පුස්තකාලය
මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
මොරටුව.



**1·4 සංඛ්‍යා සටහන**
**ප්‍රාග්ධන වියදමෙහි ආනයනිත ප්‍රමාණය**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1983 | 1984 | 1985 |
|---|---|---|---|
| 1. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 35,342 | 39,558 | 41,106 |
| 2. ආනයනිත ආයෝජන භාණ්ඩ (මි.ර.ගැ. වටිනාකම) .. | 10,900 | 11,443 | 9,488 |
| 3. නැව් සහ ගුවන් යානා හැර ආනයනිත ආයෝජන භාණ්ඩ (මි.ර.ගැ. වටිනාකම) .. | 9,298 | 10,512 | 7,877 |
| 4. ආනයනිත ප්‍රමාණය (අංක 2, අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 30·8 | 28·9 | 23·1 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ආනයනිත ආයෝජන භාණ්ඩයන්හි මෙම තියුණු අඩුවීම වූ කලී 1984 දී වූ සියයට 5.0 ක වැඩිවීමට හාත්පසින්ම වෙනස් වූවකි. ප්‍රාග්ධන වියදමෙහි අඩංගු ආනයනිත භාණ්ඩ ප්‍රමාණය අඩුවීමට විශේෂයෙන් හේතු වූයේ මහවැලි යෝජනා ක්‍රමයෙහි කටයුතු සම්පූර්ණ වීමය. මෙම සම්පූර්ණ කිරීම නිසා ප්‍රාග්ධන භාණ්ඩ ආනයනයෙහි විශාල පහත වැටීමක් සිදුවිය.

දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙන් සියයට 73.2 ක් පෞද්ගලික අංශයේ හා රජයේ සංස්ථා හා සම්බන්ධිතය. මෙම ප්‍රතිශතය 1984 දී මෙම අංශයේ වූ ප්‍රාග්ධන සම්පාදනයට වඩා තරමක් අඩුය. 1984 දී මෙන් මෙම වසරේ ද ප්‍රාග්ධන සම්පාදනයේ විශාලතම කොටස සිදුවූයේ ගොඩනැගිලි හා අනෙකුත් ඉදි කිරීම් කටයුතු තුළය. මෙම උප අංශයේ පවත්නා මිල යටතේ ප්‍රාග්ධන සම්පාදනය 1984 දී වූ සියයට 14.6 ක වැඩිවීම හා සසඳා බලන විට 1985 දී සියයට 4.1 කින් වැඩි විය. යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ, ප්‍රවාහන උපකරණ හා අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩයන්හි වූ ප්‍රාග්ධන සම්පාදනය 1985 දී පහත වැටුණි. ප්‍රාග්ධන සම්පාදනයෙහි අනෙක් එකම වැඩිවීම වූයේ නැවත වගාකිරීම් හා ඉඩම් සංවර්ධනය යන උප අංශයේ සිදු වූ සියයට 32.1 ක වැඩිවීමය.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි පැවැති මුළු සම්පත් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 2,21,300 න් දේශීය වශයෙන් රුපියල් දශ ලක්ෂ 1,59,800 ක්ද (සියයට 72.2), ආනයන මඟින් රුපියල් දශ ලක්ෂ 61,500 ක්ද (සියයට 27.8) ලැබී ඇත.

සම්පත් වලින් සියයට 18.7 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැය වූ අතර, සියයට 62.3 ක් පරිභෝජනය සඳහා ද සියයට 19.0 ක් භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනයන් මත ද වැය විණ. 1984 වසරේ දී වැය වූ ප්‍රමාණයන් ප්‍රාග්ධන සම්පාදනය සඳහා සියයට 19 ක්ද, පරිභෝජනය සඳහා සියයට 59.5 ක්ද, භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා සියයට 21.4 ක්ද වේ.

1978 ස්ථාවර මිල අනුව ගණනය කරන ලද මුළු සම්පත් ප්‍රමාණය 1984 දී සියයට 3.7 කින් වැඩි වූ අතර 1985 දී එහි වැඩි වීම සියයට 4.7 ක් විය. 1984 දී සියයට 0.7 ක ආන්තික වැඩිවීමක් දැක්වූ භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනයන් 1985 දී සියයට 4.1 කින් වැඩිවිය. 1985 දී මුළු පරිභෝජනය සියයට 2.2 කින් වැඩි වූ අතර එය 1984 දී වැඩි වූයේ සියයට 1.5 කිනි. 1984 දී සියයට 1.2 න් වැඩි වූ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය මෙම වසරේදී සියයට 2.0 කින් වැඩිවිය. පසුගිය වසරේ සියයට 7.2 ක වැඩිවීම හා සසඳන කල, 1985 දී රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන සම්පාදනය සියයට 33.8 ක වැඩිවීමක් දක්වීය. පෞද්ගලික අංශයේ හා රාජ්‍ය සංස්ථාවන්හි ප්‍රාග්ධන සම්පාදනය 1984 දී සියයට 0.9 කින් පහත වැටුණු අතර, එය 1985 දී සියයට 9.7 කින් අඩු විය.

44744

## 1 . 5 සංඛ්‍යා සටහන

### සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1978 – 1985

| ශීර්ෂය | වර්තන වෙළෙඳ මිල අනුව (රු: දශ ලක්ෂ) | | | | 1978 මිල අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1983 (අ) | 1984 (අ) | 1985 (අ) | 1978 | | 1983 (අ) | | 1984 (අ) | | 1985 (අ) | | 1983 ට වඩා 1984 | 1984 ට වඩා 1985 |
| | | | | | වටිනාකම රු: දශ ලක්ෂ | % | වටිනාකම රු: දශ ලක්ෂ | % | වටිනාකම රු: දශ ලක්ෂ | % | වටිනාකම රු: දශ ලක්ෂ | % | | |
| 1. මුළු සම්පත් .. | 59,537 | 171,982 | 207,163 | 221,281 | 59,537 | 100 | 81,472 | 100 | 84,508 | 100 | 88,503 | 100 | 3·7 | 4·7 |
| 1.1 වෙළෙඳ මිල අනුව ද. දේ. නි. .. | 42,665 | 121,601 | 153,746 | 159,787 | 42,665 | 72 | 56,049 | 69 | 58,907 | 70 | 61,852 | 70 | 5·1 | 5·0 |
| 1.2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | 16,872 | 50,381 | 53,417 | 61,494 | 16,872 | 28 | 25,423 | 31 | 25,601 | 30 | 26,651 | 30 | 0·7 | 4·1 |
| 2. උපයෝගිකරණය .. | 59,537 | 171,982 | 207,163 | 221,281 | 59,537 | 100 | 81,472 | 100 | 84,508 | 100 | 88,503 | 100 | 3·7 | 4·7 |
| 2.1 පරිභෝජනය .. | 36,148 | 104,834 | 123,170 | 137,872 | 36,148 | 61 | 51,191 | 63 | 51,959 | 62 | 53,100 | 60 | 1·5 | 2·2 |
| 2.2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 8,521 | 35,342 | 39,558 | 41,106 | 8,521 | 14 | 14,278 | 17 | 14,449 | 17 | 14,745 | 17 | 1·2 | 2·0 |
| 2.2.1 රජය .. | (3,077) | (5,963) | (7,075) | (11,009) | (3,077) | (5) | (3,628) | (4) | (3,890) | (5) | (5,205) | (6) | 7·2 | 33·8 |
| 2.2.2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල .. | (2,056) } | (29,379) | (32,483) | (30,097) | (2,056) | (3) | (10,650) | (13) | (10,559) | (12) | (9,540) | (11) | –0·9 | –9·7 |
| 2.2.3 පෞද්ගලික අංශය .. | (3,388) } | | | | (3,388) | (6) | | | | | | | | |
| 2.3 තොග වෙනස්වීම් .. | 33 | – 210 | 150 | 225 | 33 | — | – 55 | — | 36 | — | 63 | — | — | — |
| 2.4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 14,835 | 32,016 | 44,285 | 42,078 | 14,835 | 25 | 16,058 | 20 | 18,064 | 21 | 20,595 | 23 | 12·5 | 14·0 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1984 දි රුපියල් දශ ලක්ෂ 30,600 ක්වූ දේශීය ඉතිරිකිරීම් ප්‍රමාණය 1985දී සියයට 28.3 ක අඩු වීමක් දක්වමින් රුපියල් දශ ලක්ෂ 21,900 ක් වී ඇත. මෙය 1983 හා 1984 යන දෙවසරේම සිදු වූ දේශීය ඉතිරිකිරීම්හි සැලකිය යුතු වැඩිවීමට හාත්පසින්ම වෙනස්වූවකි. වෙළෙඳ මිල අනුව වූ දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස බලන කල, 1984 දී සියයට 19.9 ක්වූ දේශීය ඉතිරිකිරීම්, 1985 දී සියයට 13.7 ක් බවට පත්විය. විදේශීය ශුද්ධ සාධක ආදායම හා පෞද්ගලික සංක්‍රාම ද ඇතුළත් වන මුළු ජාතික ඉතිරිකිරීම් 1985 දී සියයට 24.6 ක අඩුවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 25,800 ක මට්ටමකට ලඟා වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ජාතික ඉතිරිකිරීම 1984 දී සියයට 22.2 වූ අතර 1985 දී එය සියයට 16.1 ක් බවට අඩුවිය.

### 1 . 6 සංඛ්‍යා සටහන

### ජාතික ඉතුරුම් 1983 – 1985 (පවත්නා වෙළෙඳ මිළ අනුව)

රු: දශ ලක්ෂ

| ශීර්ෂය | 1983 (අ) | 1984 (අ) | 1985 (අ) |
|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 1,21,601 | 1,53,746 | 1,59,787 |
| 2. දේශීය ඉතුරුම් .. | 16,767 | 30,576 | 21,915 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදයම .. | –3,214 | –3,401 | –3,410 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් .. | 6,441 | 7,031 | 7,298 |
| 5. ජාතික ඉතුරුම් .. | 19,994 | 34,206 | 25,803 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 1, අංක 2 හි ප්‍රතිශතයක් ලෙස) | 13·8 | 19·9 | 13·7 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5, අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 16·4 | 22·2 | 16·1 |

(අ) තාවකාලිකයි. මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.